# 7 ශ්‍රේණිය -භූගෝල විද්‍යාව-පැවරුම්

1) ලෝක ආකෘති සිතියමක පහත සඳහන් දෑ ලකුණු කර නම් කරන්න.(සමකය , කර්කටක නිවර්තනය, මකර නිවර්තනය , සම්මත දින රේඛාව, ග්‍රී නිච් රේඛාව , සාගර පහ , මහද්වීප හත, ඉන්දියන් සාගරයේ දූපත් )

2) ශ්‍රී ලංකාවේ නිරපේක්ෂ හා සාපේක්ෂ පිහිටීම ලියන්න.

3) රාෂ්ට්‍රීය මුහුදු ප්‍රදේශය යන්න හඳුන්වා ,සාගරයේ වැදගත්කම ලියන්න.

4) ශ්‍රී ලංකාවේ භූවිෂමතා කලාප ලකුණු කර නම් කරන්න .ඒ ඒ භූවිෂමතා කලාපයේ ඇති භූ ලක්ෂණ වගුගත කරන්න.

5) මධ්‍යම කඳුකරය දැක්වෙන සිතියමක් පිටපත් කර පහත සඳහන් දෑ ලකුණු කර නම් කරන්න.(ප්‍රධාන කඳු පන්ති,සානු,කපොලු,දිය ඇළි )

6) ලංකාවට වර්ෂාපතනය ලැබෙන ක්‍රම නම් කරන්න.එක් වර්ෂාපතන ක්‍රමයක් කෙටියෙන් පැහැදිලි කරන්න.

7) ලංකාවේ දැකිය හැකි ලෝක උරුම පහක් ලංකා සිතියමක ලකුණු කර නම් කරන්න

8) දකුණු ආසියාවේ සමාජීය සංවර්ධනය ඉහළ අගයක් පවත්නා රටවල් දෙකක් නම් කරන්න.

9) සාක්ෂරතාවය යනු කුමක්ද ? වර්තමානයේ ලංකාවේ සාක්ෂරතාව හා ආයු අපේක්ෂාව කොපමණද ?

10)ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ දියුණුව හේතුවෙන් සිදුවන ප්‍රතිඵල හතරක් ලියන්න.

11) ඉහළ සාක්ෂරතාවක් හා ඉහළ ආයු අපේක්ෂාවක් ඇතිවීමට බලපා ඇති කරුණු මොනවාද ?

12) ලංකාවේ මුළු වර්ගප්‍රමාණය කොපමණද ?

13) භූ දර්ශනය යනු කුමක්ද ? ලංකාවේ දැකිය හැකි භූ දර්ශන නම් කරන්න.

14) මධ්‍යම කඳුකරයේ දැකිය හැකි ලක්ෂණ තුනක් විස්තර කරන්න .

15) වියළි කලාපීය භූ දර්ශනයේ සුවිශේෂී ලක්ෂණ පහක් දක්වන්න.

16) ලංකා සිතියමක පහත සඳහන් දෑ ලකුණු කර නම්කරන්න(අනුරාධපුරය,මඩුපල්ලිය,විල්පත්තු,සෝමාවතිය,නාගදීපය,නල්ලූර් කෝවිල,නිලාවේලි,තලවිලපල්ලිය,මන්නාරම,හුම්මානය,දීඝවාපිය,පාසිකුඩා ,සිතුලපව්ව )

17) තෙත් කලාපීය භූ දර්ශනයේ දැකිය හැකි ලක්ෂණ පහක් ලියන්න.

18)යාපන අර්ධද්වීපය ආශ්‍රිත ප්‍රදේශයේ දැකිය හැකි ලක්ෂණ පහක් ලියන්න .

19)වෙරළබඩ භූ දර්ශනයේ දැකිය හැකි ලක්ෂණ පහක් ලියන්න.

20)ලංකාවේ ශාක ව්‍යාප්තිය පිළිබඳ කරුණු පහක් ලියන්න.

21) දකුණු ආසියාතික රටවල හා ඒවායේ අග නගරයන් ලෝක සිතියමක ලකු ණු කර නම් කරන්න.

22)වරහන තුළ ඇති සුදුසු වචන තෝරා හිස්තැන් පුරවන්න.

1.ඉන්දියන් සාගරයේ ඇති දූපතක් ලෙස .........................වැදගත්වේ.

2......................................දකුණු ඇමරිකා මහද්වීපයේ පිහිටි රටකි .

3.ඕස්ට්‍රේලියානු මහද්වීපයේ උතුරින් පිහිටි මුහුදක් ලෙස ........................වැදගත්වේ.

4..................................මගින් මධ්‍යධරණී මුහුද හා රතු මුහුද සම්බන්ධවේ.

5.ලෝකයේ දක්නට ලැබෙන රට අභ්‍යන්තරයේ පිහිටි මුහුදක් ලෙස .................සැලකිය හැකිය.

(ඇල්ජීරියාව,මැඩගස්කරය,ආර්ජන්ටිනාව ,එරල් මුහුද,අරාෆුරා මුහුද,සුවස් ඇළ,පැනමා ඇළ)